ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 සැප්තැම්බර් 17 සඳුදා
04 වෙළුම - 47 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



## සාහිත්‍ය මාසය

## පුංචි අපිත් පොත පත කියවීමට හුරු වෙමු

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# කියවීමෙන් ලියන්නට අත්වැලක්.

## ආදරණීය දුවේ පුතේ...

සැප්තැම්බර් මාසය ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් සාහිත්‍ය මාසය ලෙස සැලකේ. සාහිත්‍ය උත්සව, රාජ්‍ය සම්මාන, විවිධ සම්මාන සමඟ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයද සැප්තැම්බර් මාසය තුළ සිදු කැරේ. මේ නිසාම පුංචි දුවා පුතාලා සමඟ සාහිත්‍යයේ වටිනාකම හා එහි නියැලීමේ වැදගත්කම ගැන කරුණු කාරණා බෙද හද ගත යුතු යැයි මට හැඟෙනවා.

සිරුරේ වැඩීමට ආහාර අවශ්‍ය වන්නාසේම මනසේ වැඩීමටද පෝෂ්‍යදායි ආහාර අත්‍යාවශ්‍යයි. සිරුරට ආහාර අප දිනපතා බඩගින්නත් සමග ගන්නා බව නොරහසකි. එහෙත් මනසේ වැඩීම සඳහා පෝෂ්‍යදායි ආහාර අප ඒ හා සමානව ලබා ගන්නේද? ශාරීරික පෝෂණය හීනවූ කල මන්දපෝෂණ තත්ත්වයක් ඇතිවන අතර එය උග්‍ර වූ විට බාහිරවද දැකගත හැකිය. මනසේ පෝෂණය හීනවූ කල මානසික මන්දපෝෂණ තත්ත්වයක් ඇතිවිය හැකි අතර එය පහසුවෙන් බාහිරව ප්‍රදර්ශනය නොවේ. එය බැරෑරුම් ලෙස සිතා බැලිය යුතු තත්ත්වයකි.

ශාරීරික වැඩීමට පෝෂ්‍යදායි ආහාර අවශ්‍ය වන්නාක් මෙන් මානසික වර්ධනයට හොඳ පොත්පත් කියවිය යුතුය. මනසට පෝෂ්‍යදායි ආහාර ලබා දිය හැකිවන්නේ හොඳ පොත්පත් කියවීමෙනි. දැනුම, අවබෝධය, කුසලතා හා බැඳි බොහෝ කරුණු කාරණා ජයගත හැකි වන්නේ කියවීමෙනි. ''කියවීම මිනිසා සම්පූර්ණ කරයි'' යනුවෙන් ඉපැරණි ආප්තෝපදේශයක්ද ඇති බව ඔබ අසා ඇති. ඉන් කියැවෙන්නේද මිනිසත් බවේ පූර්ණත්වය ලබා ගැනීම සඳහා කියවීම මොනතරම් වැදගත් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනවාද යන්නයි.

එහෙත් අවාසනාවකට මෙන් දැන් දැන් කියවීමේ ඉතාමත් වැදගත් පුරුද්ද අප අතරින් - විශේෂයෙන් දුවා දරුවන් අතරින් කෙමෙන් ඈත් වෙමින් පැවතීම කනගාටුවට කරුණකි. පොත්පත් කියවීමේ විනෝදාංශය වෙනුවට අන්තර්ජාලයේ සැරිසැරීම බඳු නූතන තාක්ෂණික මෙවලම් හා හරඹ කිරීම එහැටි අරුමයක් නොවේ.

එහෙත් කනගාටුවට හේතුව වන්නේ දැනුම අවබෝධය හඹා යමින් කුසලතා නංවා ගැනීම වෙනුවට ෆේස් බුක් වැනි උපාංග ඔස්සේ දනුම හා බුද්ධි වර්ධනයට හේතුකාරක නොවන අංශයන් තෝරා ගැනීමයි. මේ ගැන දෙවරක් සිතා බැලිය යුතුය.

දුවේ පුතේ, කියවීම මගින් ලබාගන්නා දැනුම උපයෝගී කර ගනිමින් ලේඛනයට අත්පොත් තැබීමට ඔබට හැකිය. පුංචි ඔබ ලේඛනයට යොමු නොවෙතොත් හෙට දිනයට අපට ලේඛක පරපුරක් කොයින් ද? වැඩි වැඩියෙන් කියවමින් - ඒ පිළිබඳව අධ්‍යයනය කරමින්, ඔබගේ සිතිවිලි කොළයක සටහන් කරමින් මේ සඳහා මුල පිරිය හැකිය.

ළමා වියේදීම එසේ ලේඛනයට පිවිසෙන්නට ඔබ සමත් වූ කල ඔබේ අනාගත ගමන් මග වැටී ඇත්තේ සැබෑ ලේඛක හිමිකම් දෝතින් තුරුළු කරගෙනය. අද මෙරට පමණක් නොව පිටරටද මහා ලේඛකයන් වී ඇති ඇත්තන් ඊට මුලපුරා ඇත්තේ තැබූ එක් කුඩා පියවරක් සමගිනි.

කතෝලික දූ දරුවන් වශයෙන් කියවීම පුරුද්දක් කරගෙන ඒ ඔස්සේ ලිවීම හුරු කරගත් කල ඔබටත් හෙට දිනයේ කතෝලික ලේඛක සංසයට එක් විය හැකිය. ඊට ආධාර අනුබල නිතිපතා ලබා දීමට ළමා ප්‍රදීපය සූදනම්. ඒ සඳහා ඔබ සැමට ආරාධනා !

**ඔබ සැමට ජේසු පිහිටයි !**

**ශිරාන් මෛත්‍රී**
ඥානාර්ථ ප්‍රදීපය සහකාර සංස්කාරක

# පෘතුගීසීන්ට පෙර කිතුනුවෝ සිටියහ.

ආදියේ සිට ලක්බිමේ කිතුනුවන් සිටි බව සනාථ කෙරෙන සාධක රැසක් ඉන්දීය ඉතිහාස ග්‍රන්ථ රැසෙක සඳහන් වී ඇත. ඉන්දියාවේ ඉතිහාස ලිපි පළ කළ ලැරී පෙරෙයිරා බොම්බේ එක්සැමිනර් පුවත් පතේ පළ කළ ලිපියක් අනුව පෘතුගීසීන් එහි පැමිණීමට පෙර දකුණු ඉංදියාවේ 80,000 (අසූ දහසක්) ඉක්මවා ගිය කතෝලික පිරිසක් සිටි බව වාර්තා කොට ඇත.

එසේම ඉන්දීය ඉතිහාසය පිළිබඳව විශේෂඥ දැනුමක් ඇති ආචාර්ය එම්. මුන්ඩාඩන් පියතුමන් සහ කේ.ජේ. ජෝන් වියතාණන් ද මේ බව සනාථ කැර ඇත. ඒ කාලයේ පැවැති කතෝලික දෙව්මැදුරු රැසෙක ලේඛන ඔවුන් සතුව තිබේ. ගොඩනැගිලි ලැයිස්තුව පමණක් නොව ඒවා පිහිටි ගම් නියම්ගම් පිළිබඳව ද ඒවා ආශ්‍රිතව ජීවත් වූ පිරිස් පිළිබඳව ද තොරතුරු ඔවුන් සතුය.

ඉන්දියාව සහ ලංකාව අතර එදා සිට කිට්ටු සම්බන්ධතා පැවැති බව නොරහසකි. ඉන්දීය ජාතිකයින් වෙළඳම සඳහා මෙහි නිතර පැමිණ තිබේ. දෙ රටේ ධීවර පිරිස් අතර ද කිට්ටු සම්බන්ධතා පැවැතිණි.

එසේ ම දකුණු ඉන්දියානු කණ්ඩායම් පදිංචිය සඳහාම ද මෙහි පැමිණ ඇත. ආර්ය වංශයට අයත් පිරිස දිවයිනට පැමිණ ඇති බවත් සිංහල වංශය ඇති වුයේ එයින් බවත් අප හෙළ ඉතිහාසයේ සඳහන් වේ.

මේ සියල්ලෙන් පෙනී යන්නේ දෙරට අතර පැවැති කිට්ටු සම්බන්ධතාවයි. මේ අනුව

**ලංකාවටද කිතු දහම තෙවැනි සත වසර වන විට පැතිර ගොස් තිබුණු බව "තෝමපීඩියා" නම් වූ ප්‍රකට ග්‍රන්ථයේ ගත් කරු ආචාර්ය ජෝර්ජ් මෙනච්චෙරි සටහන් කර ඇත. (එහි දසවැනි පිටුව ) ක්‍රිස්තු භක්තිකයන් සය වැනි සත වසරේ හෙවත් අනුරාධපුර යුගයේ දී ද මෙහි සිටි බව අනාවරණය වන්නේ ය.**



## සිරිලක කිතුනු ඉතිහාසය

**අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි**

දකුණු ඉන්දියාවෙන් මෙන් ම එහි සිටි පර්සියානු ජාතිකයන් ගෙන් ද කිතු දහම ද මෙහි පැමිණි බව පිළිගත හැකිය. පර්සියානු විශාල පිරිසක් එකල ඉන්දියාවට මෙන්ම ලංකාවටද වෙළඳම සඳහා පැමිණ ඇත. මොවුන් අතර බොහෝ දෙනෙක් කිතුනුවෝ වූහ, එසේම මෙතරම් විශාල කිතුනු පිරිසක් සිටි දකුණු ඉන්දියානු කේරලයෙන් පැමිණ , වෙළඳම මෙන් ම සෙසු රැකියාවන් ද කළ පිරිස අතර කතෝලික බැතිමතුන් සිටීම පුදුමයට හේතුවක් නොවේ.

මේ බව සනාථ කරනු වස් දිවයින තුළම සාධක රැසෙකි. ලංකාවේ මාන්තෙයි හෙවත් මන්නාරමේ සහ ගෝකන්න හෙවත් ත්‍රිකුණාමලය යන පළාත්වල දේශීය කිතුනු පිරිස් සිටි බව සඳහන් වන්නේ ය.

මේ ගැන වැඩියක් දැන ගැනීම සඳහා '' ලක්දිව කිතුනු පුරාණය'' රීටා වෙල්ගම්පල ග්‍රන්ථය බලන්න)

ලංකාවටද කිතු දහම තෙවැනි සත වසර වන විට පැතිර ගොස් තිබුණු බව ''තෝමපීඩියා '' නම් වූ ප්‍රකට ග්‍රන්ථයේ ගත්කරු ආචාර්ය ජෝර්ජ් මෙනච්චෙරි සටහන් කර ඇත. (එහි දසවැනි පිටුව )

ක්‍රිස්තු භක්තිකයන් සය වැනි සත වසරේ හෙවත් අනුරාධපුර යුගයේ දී ද මෙහි සිටි බව අනාවරණය වන්නේ ය. ක්‍රි.ව.550 දී පමණ මෙහි පැමිණි කොස්මස් ඉන්ඩොක්ලෙප්ටෙස්ටස් නමැති විදේශිය සංචාරකයා ''ටිපොග්‍රෆියා ක්‍රිස්ටියානා'' නමින් ලියා ඇති ග්‍රන්ථයේ මේ වග විස්තර කැර ඇත.

අනුරාධපුරයේ ඔහු දුටු දෙව් මැදුරක් මෙන් ම හමු වූ පූජක තුමකු සහ කිතුනු පිරිසක් පිළිබඳව ද හෙතෙම සඳහන් කරයි.

අපගේම පුරාවිද්‍යා කොමසාරිස් තනතුර දැරූ වියත් මහාචාර්ය සෙනරත් පරණවිතාන මැතිතුමා ද ''සීගිරි පුවත '' නමැති ග්‍රන්ථයේ සඳහන් කැර ඇත්තේ සීගිරි යුගයේ ද කිතුනු පිරිස් මෙහි ජීවත් වූ බව යි.

ක්‍රි.ව. 1912 දී අනුරාධපුර කරන ලද පුරාවිද්‍යා කැනීම්වලදී හමුවූ කුරුස ලාංඡනය සහිත කුළුන එහි පැරැණි දෙව් මැදුරක ගල් කනුවකි. එ වැනි තවත් කුරුසියක් කොළඹ මෝදර දී කැලණි ගඟේ මෝය කට අද්දර තිබී හමු වී ඇත. මේ වැනි කුරුසියක් ගෝවේ පුරයේ දී ක්‍රි.ව. 2000 මැයි මස හමු වූ බව වාර්තා විය. එසේ එවැන්නක් පාකිස්තානයේ තක්සිලා නුවර තිබී ද හමුවිය.

අනුරාධපුර කුරුසිය ශු. තෝමස් මුනිවරයාණන් මරණයට පත් කරන ලද මයිලාපෝර්හි පිහිටා ඇති ''ලේ ගැලූ ''කුරුසියට සමාන බව පිළිගනු ලැබේ. මෙය අද දක්වා එහි දැකගත හැකිය. දක්ෂ වඩු කාර්මිකයකු වූ එතුමන් විසින්ම මෙම විසිතුරු කුරුසිය නිමවන ලදැයි පිළිගනු ලැබේ.

මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ දිවයින තුළ සංවිධානාත්මක දහම් ප්‍රචාරක වැඩ පිළිවෙළක් නොතිබුනත් පෘතුගීසින්ගේ පැමිණීමට පෙර ආදියේ සිට ම දිවයිනේ කිතුනු පිරිස් සිටි බව යි.

# දිව්‍යසත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ ආරක්ෂක මුනිවරයාණෝ



## සුදුවර චරිතයක් හඳුනාගනිමු



ශු. තාර්සියුස් මුනිතුමා

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ ආරක්ෂක මුනිවරයාණන් ලෙස සැලකෙන්නේ ශු. තාර්සියස් තුමාය. එතුමා ක්‍රි.ව. 258 දී පමණ රෝමයේ ජීවත් වූ අතර මේ කාලය ශු. සභාවට පීඩන සමයක් ලෙස පැවති කාලපරිච්ඡේදයකි. මේ නිසාම එකල අගරජ ව සිටි වැලේරියානු අගරජ කිතු දහම තුරන් කිරීමට උත්සහ කළ අතර බොහෝ කිතුනුවෝ මේ කාලයේ දී ස්වාමින් වහන්සේ උදෙසා සිය රුධිරය හා දිවිපුදා ප්‍රාණපරිත්‍යාගී කිරීටය හිමිකර ගත්තෝය.

කුඩා කල සිටම තාර්සියස් හට තම දෙමාපියන්ගේ රැකවරණය නොලැබුන අතර ඔහුගේ දෙමාපියන් ද අගරජුගේ පීඩනයට ලක්ව මියගියෝය. සිය මව මිය යන මොහොතේදී ඔහු හට කියු වදන් ඔහුගේ සිත් තුළ නිතිපතා රැව්දුන් අතර ඒවා නම් ‘‘මම මගේ පුත් තාර්සියස් හට බොහෝ ආදරය කරමි. ඔහුට කියන්න මම ඔහු එනතුරු ස්වර්ගයේ සිටින බව ’’ යන්නය. මේ කාලයේ කිතුනුවෝ ඒකරාශි වුයේ භූගත සොහොන් ගෙවල් වූ කැන්ටුම්බ වලය මෙකල සිටි පාප්තුමාට ද සභා ශ්‍රේෂ්ඨයන්ටද අගරජුගේ මෙම පීඩන ඉමහත් තර්ජනයක් වු අතර හිරගෙදර සිටි කිතුනුවන්ගෙන් පිරිසක් අගරජු විසින් මරණ දණ්ඩනයට තින්දු කර ඇති බවත්, ඊට පෙර ඔවුන් තමන්ගෙ අන්තිම ආශාව හා අභිප්‍රාය ලෙස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආශාවන බවත් පණිවුඩකරුවන් අත කියා එවීය. මෙම අවදානම් සහිත තත්ත්වය තුළ කිසිවකු හිරගෙදරට යාමට ඉදිරිපත් නොවු අතර, එකහෙලා කුඩා තාර්සියස් ඉදිරියට පැමිණ මා යැව්ව මැනව , මා කුඩා දරුවකු හෙයින් ඔවුන් මා ගණන් නොගනීවි’’ පැවසුවේය.

පාප්තුමාද අවසානයේ තාර්සියස් හිර ගෙදරට යැවීමට එකඟ වු අතර පසු දින උදේ දිව්‍ය පුජාවෙන් පසු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බඳුනක තබා ‘‘දැන් යන්න , ඔබ උසුලා ගෙන යන ස්වාමින් වහන්සේ ඔබ සමඟ ද වේවා’’ යැයි පවසා තාර්සියස් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සහිත කුඩා පසුම්බිය තම කර වටේ දමා ගෙන ඔහුගේ ඇඳුමට යට කර ගත්තේය තමාටම කියා ගනිමින් ‘‘මගේ හදවත මත මම ජේසු සමිඳුන් උසුලාගෙන යන්නෙමියි පවසා, කිසිවකුගේ සැලකිල්ලට භාජනය නොවි , හිරගෙදරට ගොස් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හිරකරුවන් වූ කිතුනුවන් වෙත ලබා දී ආපසු එන ගමනේදී පාසලක් හරහා යාමට සිදු වූ හෙයින් ඒ අසල ක්‍රීඩා කරමින් සිටි ළමා පිරිසක් තමන් හා එක්ව ක්‍රීඩා කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. එහෙත් ඔහු ඔවුන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ අතර, ඔබ හදවතින් අල්ලා ගෙන සඟවා ගෙන රැගෙන යන්නෙ කුමක්ද? එය අපට ද පෙන්වන්නැයි එම ළමුන් පෙරැත්ත කළ නමුත් ඔහු එයද ප්‍රතික්ෂේප කළේය. ඔහු එම ඉල්ලිම ප්‍රතික්ෂේප කළ හෙයින් එම දරුවන් ඔහුගේ ඇඟට කඩා පැන කෙසේ හෝ සඟවා ගෙන සිටින දේ පෙන්වන ලෙස ඉල්ලා සිටියේය. යකඩ පොලු රැගෙන ඔහුට පහර දුන් අතර , ඉතා ශෝචනීය ලෙස ඔහු වේදනා වින්දේය. මේ කාලයේ දී කිතුනුවන් විසින් ආධාර උපකාර කළ කිතුනු සෙබලෙක් තම සගයන් සමඟ පැමිණ ළමුන් පිරිස පන්නා දමා තාර්සියස් ඔසවා ගෙන පාප්තුමා සිටි බිංගෙට ගෙන ගිය අතර තමාට පහර දුන් අය දෙස බලා සුසුම් හෙලා ’’ජේසුනි මම මරණයට පත්වන තුරු ඔබවහන්සේව ආරක්ෂා කළෙමි මේ ළමයින්ට සමාව දෙනු මැනවැ’’යි පැවසීය.

එම කිතුනු හිතෛෂි සෙබලා ද තාර්සියස් ඔසවාගෙන පාප්තුමා විසූ බිංගෙට ගිය අතර පාප්තුමා ද ‘‘ඔබේ ආදරයෙන් පිරි ත්‍යාගවන්තකම නිසා ජේසු සමිඳුන් සුරක්ෂිතව සිටින සේකැයි පවසා තම හදවතින්ම ජේසු සමිඳුන් ස්පර්ශ කරමින් ස්වර්ගස්ථ විය. තාර්සියස් මියගියේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තම හදවතට තුරුළු කර ගෙනය. මෙය කොතරම් අලංකාර මරණයක්ද?

එබැවින් ශු. තාර්සියස් තුමා පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන්ගේ ආරක්ෂක මුනිවරයා ලෙස සභා මාතාව නම් කර ඇත.

**අසේල දසනායක**



## ජේසුගෙන් ළමා ඔබට

# සාධාරණ විනිසකරුවාණෝ

විශ්වාසයෙන් ජේසු සමග කථා කර ජීවිත අරගල ප්‍රශ්න විසඳ ගන්නේ කෙසේද කියා පසුගිය ලිපියෙන් පැහැදිලි කළෙමි.

දෙවියන් වහන්සේ සාධාරණ විනිශ්චකරු බවට අත්දුටු සිදුවීමක් ඔබ සමග බෙදා ගනිමි.



දික්කසාද වූ මගේ යාළුවෙක් තම දියණියගේ අයිතිය ඉල්ලා නඩු පැවරීය. එහිදී දුන් විනිශ්චයට අනුව සති අන්තයේ දියණිය ගෙදර රැගෙන යාමට ඔහුට අවසර දෙන ලදි.

එයට අකමැති වූ දියණියගේ මව මහාධිකරණයේ මෙම විනිශ්චයට විරුද්ධව නඩුවක් පැවරීය. ඇයගේ පැත්තෙන් නඩුව සඳහා එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් සභාවේ නීතිඥවරු කිහිප දෙනෙක් කථා කළෝය.

අවසාන නඩු දිනයේදී ද යළුවා පැරදුනි. ඔහුට අසාධාරණ විනිශ්චයක් ලැබී දරුවා සමඟ සතියකට පැය දෙකක් පමණ කථා කරන්නට අවසර ලැබිණි. අවසාන විනිශ්චය ලබා දුන් ලියවිල්ල ගැනීමට හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන්නට මගේ යහළුවා අධිකරණයට ගියේය. ඒ මොහොතේම මම ද දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරිපිට මෙසේ යාච්ඤා කළෙමි.

''ආදර ජේසුනි මෙම තීන්දුවේ සාධාරණ හෝ අසාධාරණ බව දන්නේ ඔබවහන්සේ පමණයි. කරන්න බැරි කිසිවක් ඔබ වහන්සේට නැත. මගේ මිත්‍රයාට යුක්තිය ඉටු කළ මැනව ''කියා මා යාච්ඤා කළෙමි. සිතාගත නොහැකි දෙයක් සිදු විය. සම්පූර්ණ විනිශ්චයම වෙනස් වී ඇත මුලදී මෙන් සති අන්තයේ දියණිය ගෙදර ගෙන යාමට අවසර ලැබී ඇත. යාළුවාගේ නීතිඥවරයාද ඇදහිය නොහැකි පුදුමයකට පත් විය.

ගරු ශිරෝමා ප්‍රනාන්දු සොයුරිය

## මොරටුව සා. සෙබස්තියන් විදුහල් කලා උලෙළ

මොරටුව සා. සෙබස්තියන් විදුහලේ ගුරු මඬුල්ල හා කලා සංගමයන් එක්ව සංවිධානය කරන ''රන්සුණු යාය 2 '' කලා උලෙළ 2012 සැප්තැම්බර් මස 21 වන සිකුරාදා දින ප.ව. 2.00 ට විදුහල් ශාලාවේදී පැවැත්වේ.

මෙවර කලා උලෙළ පැවැත්වෙන්නේ ප්‍රවීණ නළු, සිනමා, වේදිකා හා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂ ධර්මසිරි බණ්ඩාරණායක මහතාගේ ප්‍රධානත්වයෙනි. (කුමර)



සේයා :- ටෝනි නිශාන්ත ප්‍රනාන්දු

මාසික සිතිවිල්ල

## මාසික සිතිවිල්ල

“සැප්තැම්බර් මාසය”

ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සොරකම් නොකරන්න අනුන් සතු දේ ආශා නොකරන්න

★ **හත්වන සහ දසවන දේව පනත්වලට විරුද්ධව අප සිදුකරන පාප කවරේද? හත්වන දේව පනත අනුව ජීවත්වීම සඳහා ඔබ අනුගමනය කළයුතු කරුණු තුනක් ඉදිරිපත් කරන්න**

- තම රැකියාව නිසිලෙස ඉටු නොකිරීම
- පොදු දේපල තමාගේ පෞද්ගලික භාවිතයට ගැනීම
- නොවටිනා හා බාල භාණ්ඩ වැඩි මිලට විකිණීම
- ඉඩකඩම් හා වටිනා දේ පවරාගැනීම , සින්නක්කර ගැනීම
- අන් අයගේ තනතුරු නැතිකර තමන් ඒ තැනට පත්වීම
- වංචනිකව ක්‍රීඩා කිරීම/ ඒවායින් ජයග්‍රහණ ලබාගැනීම
- හොර විභාග / උප්පැන්න / චරිත සහතික ලබාගැනීම
- පාසල, රැකියා ආයතනය තුළ ඇති පොදු දේ විනාශ කිරීම
- රූපවාහිනි /ගුවන්විදුලි බලපත්‍ර / වරිපනම් බදු / විදුලි බිල්පත් ආදිය නොගෙවීම
- අධික ලාභ , පොළී සහ කොමිස් ලබාගැනීම
- වටිනා දේ අඩු මුදලට තක්සේරු කිරීම/මිලදී ගැනීම
- වැට මායිම් වෙනස් කිරීම
- අල්ලස් ගැනීම හා අල්ලස් දීම
- අන් අයගේ අයහපත ගැන සතුටුවීම
- ප්‍රවේශපත්‍ර නැතිව බස්රියේ /දුම්රියේ ගමන් කිරීම
- කොපිකර , වංචාකර විභාග සමත්වීම
- පොදු දුරකථන, වාහන පෞද්ගලික පරිහරණයට ගැනීම
- හොර ඡන්ද දැමීම

## බොරු නොකියන්න.

✍ **ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

★ **අටවන දේව පනත කුමක්ද?** • බොරු නොකියන්න. (ලෙවි ව්‍යවස්ථාව 19/11)

★ **අටවන දේව පනත සම්බන්ධයෙන් දිවිතීය නීති සංග්‍රහයෙහි සඳහන් වන්නේ කුමක් ද?**
- ''නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියන්න.'' (ද්.නි. සංග්‍රහය 5/20)

★ **අටවන දේව පනතට අදාළව ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කර ඇත්තේ කුමක්ද?**
- ''ඔබ මාගේ ධර්මයෙහි පිහිටා පවතින්නාහු නම්, සැබැවින්ම ඔබ මාගේ ගෝලයෝය. ඔබ සත්‍යය අවබෝධ කරගන්නාහුය. සත්‍යය ඔබ නිදහස් කරන්නේ ය'' (ජෝහන් 8/31-32)

★ **අටවන දේව පනතට අදාළ ශුද්ධවූ පාවුළු තුමා එපීසි ලිපියෙහි සඳහන් කරන්නේ කුමක්ද?**
- ''එබැවින්, බොරුකීම අත්හැර දමා අසල්වාසී එකිනෙකා සමග සත්‍ය කතා කරන්න. මන්ද අපි එකිනෙකා අන්‍යෝන්‍ය අවයවයෝ වෙමු.'' (එපීස 4/25)

★ **අටවන දේව පනතට අනුව, අදාළව ජාකෝබ් තුමා තම ලිපියෙහි සඳහන් කරන විස්තරයෙහි හික්මවිය නොහැකි විෂසෝර නපුරු ඉන්ද්‍රියක් ගැන සඳහන් කරයි. එය කුමක්ද?** • දිව (ජාකොබ් 3/1-11)

★ **අශ්වයින් දමනයට කටකලියාව දැමුවත්, සැඩ සුළඟට ගසා යන විශාල නැවක් සුක්කානමින් දමනය කළත්, කිසියම් දෙයක් දමනය කිරීම කළනොහැකි බව ජාකොබ් තුමා පවසයි. එය කුමක්ද?** • දිව දමනය (ජාකොබ් 3/1-11)

★ **අටවන දේව පනත පිළිබඳව කතෝලික සභා ධර්මෝපදේශය ග්‍රන්ථයෙහි සඳහන් ප්‍රධාන කරුණු කවරේද?**

- සත්‍යය සැඟවීම, අසත්‍යය දේ ප්‍රකාශ කිරීම මේ පනත තහනම් කරයි.
- බොරුකීම ,කේලම් කීම, බොරු චෝදනා කිරීම , බොරුවට දිවුරීම මේ පනතට විරුද්ධය
- සත්‍ය තුළ ජීවත්වීමට , ජීවිත මගින් සත්‍යයට සාක්ෂි දැරීමටත් මෙම පනතින් කැඳවයි
- සත්‍යය මත පදනම් වූ ප්‍රවෘත්ති දැනගැනීමට සියලු දෙනාට අයිතිවාසිකමක් ඇති බැවින් ජනමාධ්‍ය සතු වැදගත් යුතුකමක් ඇති බව පෙන්වා දෙයි.
- සත්‍යවාදී වන දෙවියන් වහන්සේට දේව දරුවන් සත්‍යවාදි සාක්ෂිකරුවන් විය යුතුය.
- මිනිසා එකිනෙකා හා සත්‍යවාදීව ජීවත්විය යුතුය.

# වික්ෂෝප දේව අම්මා



දේව මැණියන් ක්‍රිස්තුන් වහන්සේගේ පළමු සහ ශ්‍රේෂ්ඨතම ශ්‍රාවකයා බව අප කවුරුත් පිළිගන්නා කරුණකි. මිනිසා ගේම දුර්වලතාවය නිසා පාපයට වැටුණු ලෝකය ඉන් මුදවා ගැනීමේ ගැලවීමේ කාර්යය සඳහා දේවමැණියන්ගේ දයකත්වය අති මහත්ය. ඒ වෙනුවෙන් අම්මා කෙනකු හැටියට ඇයට විඳින්නට සිදුවූ දුක් වේදනා අනන්තය අප්‍රමාණය.

ක්‍රිස්තුන් වහන්සේ මෙලොව එළිය දුටු මොහොතේ පටන් උන්වහන්සේ කුරුසියේ මරණයට පත්වූ මොහොත දක්වාත්,ඊට පෙරත් පසුත් දේව මැණියන් තම පුතණුවන් සමඟ සිටිමින් එතුමාණන්ට ඉමහත් ශක්තියක් විය.

ශු. ජුවාම් තුමාගේ සුවිශේෂයේ සඳහන් කරන ආකාරයට ජේසුස් වහන්සේගේ මැණියෝද, මැණියන්ගේ සහෝදරිය වූ ක්ලෝපාස්ගේ භාර්යාව වූ මරියාද මග්දලාගේ මරියාද උන්වහන්සේගේ කුරුසිය ළඟ සිටියෝය. (ජුවාම් 14/25) , මරිය තුමිය කුරුසිය ළඟම සිටි බවත් පෙන්නුම් කරයි. සමදර්ශක සුවිශේෂයන් හි දක්වනුයේ කාන්තාවන් මදක් ඈතින් සිටිය බවකි.

දේව මැණියන් කුරුසිය අසලින්ම සිටියත් කුරුසියට ඈතින් සිටියත් ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසපත් වීමේ සිද්ධිය ඇයට පහසු වෙන් දරාගත හැකි සිද්ධියක් නොවූවාට නම් කිසිම සැකයක් නැත. තමා ජීවත්ව සිටියදී තම පුතණුවන් මිය යනවා දැකීම දරා සිටිය හැක්කේ කාටද?

දේව මැණියන් වික්ෂෝප දේව මාතාවන් ලෙස හඳුන්වන්නට යෙදෙන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ මෙම කුරුසියේ මරණය නිසාම නොව, 14 වන ශත වර්ෂයේ සිට පහත සඳහන් වික්ෂෝපයන් 7 වික්ෂෝපයේ දේවමාතාවන්ට සම්බන්ධ කර දක්වා තිබෙනවා.

### සිමියොන්ගේ දිවැස්වැකිය

ක්‍රිස්තුන් වහන්සේ දේවමාලිගාවේදී කැපකිරීමට රැගෙන ගිය අවස්ථාවේ සිමියොන් දිවැස්ප්‍රසාදිතුමන් විසින් පවසන ලද දිවැස්වැකිය. ''ඔබේම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මෙන් තුවාළ වනු ඇත'' (ලූක් 2/22-37)

### මිසරයට පලායාම

හෙරෝද් රජ ළදරු ජේසු සමිඳුන්ව මරන්නට සොයන බව සැළවු වහාම ජුසේතුමා සහ මරිය තුමිය මහත් ශෝකයකින් බියකින් මිසරය බලා ගමන් කිරීම (මතෙව් 2/13-15)

### ක්‍රිස්තුන් වහන්සේ දේව මාළිගාවේ නැතිවීම

ක්‍රිස්තුන් වහන්සේගේ වයස අ.වු. 12 ක් වන විට පාස්කු මංගල්‍යය සැමරීම සඳහා තම දෙමව්පියන් සමඟ ජෙරුසලමේ දේවමාලිග යට ගිය උන්වහන්සේව දේව මාලිගාවේදී දින තුනකට නැති වීම. පසුව උන්වහන්සේ පඬිවරයන් මැද කථා කරමින් සිටියදී හමු වීම (ලූක් 2/ 41-52)

### ක්‍රිස්තුන් වහන්සේ කල්වාරිය කරා යන ගමනේදී මුණගැසීම

ක්‍රිස්තුන් වහන්සේ කුරුසියත් කරතබාගෙන ගොල්ගොතාව කරා යන ගමනේදී උන්වහන්සේගේ මැණියන්ට මුණගැසීම.

### ක්‍රිස්තුන් වහන්සේව කුරුසියේ ඇණගැසීම සහ මරණය

ජුවාම් තුමාගේ සුවිශේෂය අනුව ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසිය පාමුල දේවමැණියන් රැඳී සිට ඇත. (ජුවාම් 19/25-27)

### ක්‍රිස්තුන් වහන්සේ කුරුසියෙන් බානලදුව තම මවගේ උකුලේ තැන්පත් කිරීම.

පාද නමස්කාරය භක්ති අභ්‍යාසයේ 13 වන ස්ථානයයි.

### ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී දේහය ගල්ලෙනයේ තැන්පත් කිරීම

මෙම සිද්ධිය ශු. සුවිශේෂයන් හතරෙහිම සඳහන්ව ඇත. මෙහිදි දේවමාතාවන් වඩාත් වික්ෂෝපයට පත්වන්නේ මෙය තමයි තම පුතණුවන්ව දැකිය හැකි අවසාන අවස්ථාව කියා එතුමිය සැලකු නිසාය. (මතෙව් 28/57-61, මාක් 15/42-47, ලූක් 23/ 50-56, ජුවාම් 19/38-50)

මේ ආකාරයට දේව මැණියන්ගේ දුක් විඳීම සිහිපත් කිරීම තුළ එතුමිය තම පුතණුවන්ගේ ගැළවීමේ කාර්යයට දයකත්වය දැක්වූ ආකාරය අපට වටහා ගත හැක. වික්ෂෝප දේව මාතා භක්තිය මුලින්ම ආරම්භ වනුයේ ක්‍රි.ව. 1667 දීය VII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා වර්ෂ 1847 දී සාන්තුවරයන්ගේ දින දර්ශනයට වික්ෂෝප දේවමාතා භක්තිය ඇතුලත් කිරීමත් සමඟ සමස්ත ලෝකය වික්ෂෝප දේවමාතා භක්තිය පිළිබඳව උනන්දු විය.

ආරම්භයේදී මෙම මංගල්‍යය සැප්තැම්බර් මාසයේ තෙවන ඉරුදිනට යෙදුන අතර වර්ෂ 1913 දී x වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් විසින් වික්ෂෝප දේව මාතාවන්ගේ මංගල්‍යය සැමරීම සැප්තැම්බර් මස 15 වන දිනට නියම කරන ලදී.

**ගරු ගයාන් ප්‍රසන්ත පියතුමා**
**මීසම් සහයක**
**වික්ෂෝප දේවමාතා**
**දෙව්මැදුර - පල්ලන්සේන**



## හලාවත පදවිය

නාත්තන්ඩිය ලූර්දු දේවමාතා සිද්ධස්ථානයට අයත් වලහපිටිය ශාන්ත ආනා දේවස්ථානයේ දරු දැරියෝ හය දෙනෙකු පසුගියද ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත්හ. නාත්තන්ඩිය සහයක ගරු දුමින්ද සුරේෂ් පියතුමා හා දහම් පාසල් භාර ගරු ඉමෙල්ඩා පෙරේරා පැවදි සොයුරිය සමඟ දිව බොදුන් ලැබූ ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායා රූපයකට පෙනී සිටි අයුරු . **(ශ්‍රීයාංගණී පිලීෂියා )**

## මහනුවර පදවිය



පේරාදෙණිය ශාන්ත තෙරේසා දෙව්මැදුරේ දූ, දරුවන් අට දෙනෙකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. මීසම් පාලක ගරු බාලා රාජේන්ද්‍රම් පියතුමා විසින් මෙම ප්‍රසාද නිධානය දරුවන් වෙත දනය කළ අතර මෙම සේයාරුවෙහි ගරු පියතුමා ඇතුලු දූ දරුවන් පෙනී සිටි අන්දම මෙහි දිස්වේ.

**(සේයා - මැක්සවල් රෝයි - සටහන - ජුඩ් ජේ. ප්‍රනාන්දු )**

බොල්ලත සිරිහද දහම් පාසලේ දරු දැරියෝ 36 දෙනෙකු පසුගියද ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. එහිදී දරු දැරියෝ මීසම් සේවක ගරු රොහාන් රෙහාට් සහ මේ අවස්ථාවට එක්වූ චන්දන රුද්‍රිගු යන පියතුමන්ලා සහ ඔවුන්ව පුරුදු පුහුණු කළ ගුරු මෑණි වරුන් සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **(අජිත් කමල්ප්‍රිය)**



## කොළඹ අගරදගුරු පදවිය



කලමුල්ල මීසමේ දහම් පාසල් දරු දැරියන් 78 දෙනෙකු හට ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දනය කිරීම මීසම් සේවක ගරු මොරිස් නාමල් සහයක ගරු දුලිප් කමල් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියද කටුකුරුන්ද සාන්ත පිලිප්නේරි දෙව්මැදුරේදී පැවැත්වුණි. ළමුන් සහ දරුදැරියන් පුහුණු කළ ගුරු පැවදි සොහොයුරියන් හා දහම් පාසල් ගුරු වරියන් සමූහ සේයා රුවකට පෙනීසිටි අයුරු. **(ඇන්ටනි ප්‍රනාන්දු)**

# තොඩුවාව මීසමේ ආධුනික ලේඛක ලේඛිකාවන්ට පුහුණුවක්

තොඩුවාව මීසමේ දහම් දරුවන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා තොඩුවාව සා. අන්තෝනි දෙව් මැදුරේදී පැවැත්වුණි. මේ සඳහා තොඩුවාව සා. අන්තෝනි දහම් පාසල මීට අයත්, කුඩාමඩුවැල්ල ජපමාල දේවමාතා හා බරුදැල්පොල සා. සෙබස්තියන් යන දහම් පාසල් හි ළමුන් සහභාගී වුණි.මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය හා ඥානාර්ථ ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මෙහිදි එක්වු ළමුන් හට ජනසන්නිවේදනය , පුවත්පත් කලාව හා නිර්මාණකරනය පිළිබඳව දැනුවත් කළ අතර වැඩමුළුව අවසානයේදී ලේඛක අභ්‍යාසයක්ද ලබා දුනි. මෙහි සාර්ථක නිර්මාණ ළමා ප්‍රදීපයෙහි පළකිරීමට කටයුතු යෙදීම ළමුන්ට ලැබුණු සුවිශේෂී වු අවස්ථාවකි.





මෙය කුමර නයනජිත් මහතා මෙහෙය වු 50 වන වැඩමුළුව වු අතර කේක් කපමින් උත්සවාකාරයෙන් මෙය සැමරීමට මීසම් සේවක පියතුමන්ලා කටයුතු යොදා තිබුණි. තොඩුවාව මීසම් සේවක ගරු ඉයුජින්ද සිල්වා, මීසම් සහයක ගරු දුෂාන්ත පෙරේරා (සා.බෙ.නි) පියතුමන්ලා හා ආචාර්ය මඩුල්ල එක්ව මෙය සංවිධානය කළහ. මෙදින අවස්ථාවන් මෙහි දිස්වේ.

සටහන - විල්මා ප්‍රිස්කා සේයා - ශෙහාන් දේවින්ද්‍ර

# කොළොන්නාව මීසමේ දහම් පාසල් දූ දරුවන්ගෙන්
## චිත්‍ර සහ අත්කම් ප්‍රදර්ශනයක්







කොළොන්නාව සා. ජෝශප් දහම් පාසලේ සිසු දූ දරුවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් එළිදැක්වූ චිත්‍ර සහ අත්කම් ප්‍රදර්ශනයක් පසුගියදා කොළොන්නාව සා. ජෝශප් විදුහලේ දී පැවැත්විණි. මීසම් සේවක ගරු ජූඩ් ක්‍රිසාන්ත පියතුමන්ගේ මඟ පෙන්වීමෙන් සහ දහම් ගුරු මඬුල්ලේ සංවිධානයෙන් මෙය සිදු කළ අතර ප්‍රාථමික, කණිෂ්ට සහ ජ්‍යෙෂ්ඨ අංශ වලින් හොඳම නිර්මාණයන් ද තෝරා ගැනිණි.

(ක්‍රිෂාන්ති පෙරේරා)

# හලාවත පදවියේ ළමා ලේඛක වැඩමුළුවක්

## රාජකදළුව මීසම



රාජකදළුව මීසමේ දහම් පාසල් දු පුතුන්ගේ ලේඛක කුසලතාවයන් ඔප්නැංවීමේ අරමුණින් ළමා ලේඛක වැඩ මුළුවක් 2012 සැප්තැම්බර් මස 23 වන ඉරුදින දින පෙ.ව. 9. 30 රාජකදළුව ශු. පවුලේ දෙව්මැදුරේදී පැවැත්වේ. මෙය මෙහෙය වනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. රාජකදළුව මීසම් සේවක ගරු චමින්ද ප්‍රසාද් පියතුමාගේ අනුශාසකත්වයෙන් මෙය සංවිධානය කෙරේ.

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ)
# සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 69**

## PREPOSITIONS (නිපාත පද)

6. Sunil is very popular ***among*** the other students.
(සුනිල් ඉස් වෙරි පොපියුල(ර්) එමන්ග් ද අද(ර්) ස්ටුඩන්ට්ස්)
සුනිල් අනිත් ළමයි අතරෙ හරි ජනප්‍රියයි.

7. We can't figh ***against*** natural laws.(වී කාන්ට් ෆයිට් එගේන්ස්ට් නැචුරල් ලෝස්) අපිට ස්වාභාවික නීති වලට විරුධව යන්න බෑ.

8. The tree is ***behind*** the house. (ද ට්‍රී ඉස් බිහයින්ඩ් ද හවුස්)
ගහ තියෙන්නෙ ගෙට පිටුපසින්.

9. The dog ran ***after*** the cat. (ද ඩෝග් රන් (ආෆ්ට (ර්) ද කැට්)
බළලා පස්සෙන් බල්ලා දිව්වා.

10. The dog is sleeping ***by*** the door.(ද ඩෝග් ඉස් ස්ලීපිං බයිද ඩෝ(ර්) බල්ලා දොර ලඟම නිදාගෙන ඉන්නවා.

11. The water flows ***under*** the bridge.(ද පෝට(ර්) ෆ්ලෝස් අන්ඩර් ද බ්‍රිජ්) වතුර ගලන්නේ පාළම යටින්.

12. Today the temperaure is ***below*** 50' Celsius.
(ටුඩේ ද ටෙම්පරේචර් ඉස් බිලෝ 50˚ සෙල්සියස්)
අද උෂ්ණත්වය සෙල්සියස් 50˚ ට අඩුයි.

13. The child stood ***beside*** his mother. ද චයිල්ඩ් ස්ටූඩ බිසයිඩ් හිස් මද(ර්) දරුවා ඔහුගේ මවට පසෙකින් හිටගත්ත.

14. ***Besides*** this car, he has a motor cycle
(බිසයිඩ්ස් දිස් කා(ර්) හී හැස් ද මෝටර් සයිකල්) මේ කාරෙකට අමතරව (මේ හැර) ඔහුට මෝටර් සයිකලේකුත් තියෙනවා.

බලන්න Beside සහ Besides කියන්නෙ තේරුම් දෙකක් ඇති වචන දෙකක්. Beside කියන්නෙ පසෙකින් පැත්තකින් කියන අදහස Besides කියන්නෙ “ඒ හැර” කියන අදහස.

16. The letter D comes ***before*** E in the alphabet. (ද ලෙට(ර්) ඩී කම්ස් බිෆො(ර්) ඊ ඉන්ද ඇල්ෆබට්)හෝඩියේ ඩී අකුර ඇත්තේ ඊ අකුරට කලින්.

17. The road is closed. You can't go ***beyond*** this.
(ද රෝඩ් ඉස් කලෝස්ඩ් යූ කාන්ට් හෝ බියොන්ඩ් දිස්)
පාර වහල, මෙතනින් එහාට (ඔබ්බට) යන්න බෑ.

18. The bank is ***betwen*** the school and the church.
(ද බැන්ක් ඉස් බිට්වීන් ද ස්කූල් ඇන්ඩ් ද ච(ර්)ච්)
බැංකුව තියෙන්නෙ ස්කෝලෙටයි පල්ලියටයි මැද්දෙ.

19. The ***inside*** of the car is corroded. (ද ඉන්සයිඩ් ඔෆ් ද කා(ර්) ඉස් කොරෝඩඩ්.) කාරෙකේ ඇතුල් පැත්ත මළකඩ කාලා.

20. The distance ***from*** Colombo ***to*** Galle is 72 miles.
(ද ඩිස්ටන්ස් ෆ්‍රොම් කළම්බො ටු ගෝල් ඉස් 72 මයිල්ස්)
කොළඹ සිට ගාල්ල දක්වා දුර සැතැක්ම 72.

21. I am watitng ***for*** Nimal. (අයැම් වේටිං ෆො(ර්) නිමල්.
මම නිමල් එනතුරු ඉන්නෙ,

22. One ***of*** these books is English. (වන් ඔෆ් දීස් බුක්ස් ඉස් ඉන්ගිලිස්)
මේ පොත් වලින් එකක් ඉංග්‍රීසි.

23. I got ***off*** the bus at Hendala. (අයි ගොට් ඔෆ් ද බස් ඇන් හැදල) මම හැඳලින් බස් එකෙන් බැස්සා.

24. The bird flew ***over*** the tree. (ද බර්ඩ් ෆ්ලූ ඕවර් ද ට්‍රී)
කුරුල්ලා, ගහට උඩින් පියෑඹුවා.

25. She went to school ***with*** her sister. (ෂී වෙස්ට් ටූ ස්කූල් විත් හියර් සිස්ටර්) ඇය පාසල් ගියේ ඇගේ අක්කා සමග.

26.There is a church ***near*** the lake. (දෙයා(ර්) ඉස් අ ච(ර්)ච් නියු(ර්) ද ලේක්.) වැව ලග පල්ලියක් තිබේ.

27. Sunil is just ***like*** his father. (සුනිල් ඉස් ජස්ට් ලයික් හිස් ෆාද(ර්)]
සුනිල් එයාගෙ තාත්තා වගේමයි.

28. I haven't seen him ***since*** last Sunday.(අයි හැවන්ට් සීන් හිම් සින්ස් ලාස්ට් සන්ඩේ) ගිය ඉරිදා ඉඳල මම ඔහුව දැක්කෙ නෑ.

29. I will wait ***till*** you come. (අයි විල් වේට් ටිල් යූ කම්)
ඔබ එනතුරු මම ඉන්නම්.

30. Danie is going ***to*** Colombo. (ඩැනී ඉස් ගොයිං ටූ කලම්බො)
ඩැනී කොළඹ(ට) යනවා.

31. The price of sugar has gone ***up***. (ද ප්‍රයිස් ඔෆ් සුගර් හැස් ගෝන් අප්)
සීනිවල මිළ ඉහළ ගිහින්.

32. The buses were moving ***up*** and ***down***.(ද බසස් ව(ර්) මූවිං අප් ඇන්ඩ් ඩවුන්) බස් රථ එහා මෙහා ගමන් කරමින් තිබුනා.
මෙහිදී "up" and down" කියන්නෙ “එහා මෙහා” යන අදහසයි.



මොරටුව ජයලත් අප ස්වාමි දූගේ කන්‍යාරාම විදුහලේ දැරියන් 134 දෙනෙක් පසුගියදා ගරු සන්ජීව මෙන්ඩිස් පියතුමා අතින් ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. මෙදින අවස්ථාවක් සේයා රුවෙහි දිස්වේ **(සචින්ද්‍රා ප්‍රනාන්දු)**






ඇළතුර මීසමේ ළමුන් පසුගියදා පළමු වරට දිව බොදුන් ලැබීය.

දේව මෙහෙය බෝපිටිය ලොයෙලා විදුහලේ විදුහල්පති ගරු නිශාන්ත කුරේ (පැ.තු.නි.) පියතුමාගේ ප්‍රධානත්වයෙන් ඇළතුර සා. රෝකුස් මුනි දෙව්මැදුරේදී පැවැත්වුණි. මීසම් සේවක ගරු නොයෙල් සම්පත් පියතුමන් විසින් ළමුන්ගේ බෙන්තිඟු පළඳනා ආසිරි ගන්වන අයුරු සේයාරුවෙහි දිස්වේ **(සහනි පෙරේරා)**

# ජයග්‍රහණය ලැබීමට නම්...



*ජීවිතයේ නොයෙකුත් ප්‍රශ්නයන්ට මුහුණ දීමට සිදුවීම සෑම කෙනකුටම සිදුවන අත්දැකීමකි. තමාගේ අධිෂ්ඨානය ශක්තිය, ධෛර්ය තුළ හෘදය සාක්ෂියට අනුව ක්‍රියා කිරීම ජීවිතය ජයගන්නට මුල පුරන තවත් සාධකයන්ය.*

ජීවිතයේ විවිධ ජයග්‍රහණයන් ලබා ගැනීමට නම් කැපවීම අත්‍යවශ්‍යය. පුංචි කාලයේ සිටම තම ජීවිතය අරුත් බර අරමුණකින් යුතුව අධිෂ්ඨානයෙන් ක්‍රියා කිරීම තුළින් ජයග්‍රහණයන් ලබා ගත් බව අත්දුටු කරුණකි.

වගකීම් හා යුතුකම් යන උතුම් ගුණාංග ජීවිතය තුළ පිහිටා ක්‍රියා කිරීම ජයග්‍රහණයේ මාවතක් බව සිතට ගත යුතුය.

ජීවිතයේ නොයෙකුත් ප්‍රශ්නයන්ට මුහුණ දීමට සිදුවීම සෑම කෙනකුටම සිදුවන අත්දැකීමකි. තමාගේ අධිෂ්ඨානය ශක්තිය, ධෛර්ය තුළ හෘදය සාක්ෂියට අනුව ක්‍රියා කිරීම ජීවිතය ජයගන්නට මුල පුරන තවත් සාධකයන්ය.

තමාගේම නිවසේ දී, ගමේ දී, පන්සලේ දී, පල්ලියේ දී, කාර්යාලයේ දී පමණක් නොව සමාජ සංස්ථාවේ තමා ජීවත්වන හැම තැනකදීම සමාජයේ සුබාන්තය වෙනුවෙන් ජීවිතය කැපවීම තුළ දුබාන්තය දුරලීමේ කාර්යයෙන් ජය ගන්නට නිසැකවම හැකිවනු ඇත.

තමා සැබවින්ම බොරුවෙන් , වංචාවෙන් , පලිගැනීමෙන්, හෝ වෙනත් ආත්ම තණ්හාවකින් යුතුව සමාජය බොල් හා නිරස කරන ක්‍රියාදාමයන්ගෙන් ඈත්වී තමන් අදහන ආගමක් අනුව ආගමානුකූලව ජීවත්වීමද ජයග්‍රහනයේ දොර ගුළු විවෘත කරන්න තුඩුදෙන කාරණයකි.

තමාගේ පාසලේ, පන්තියේ, පල්ලියේ, සමාජයේ හෝ කුමන තැනක ජීවත්වුවද ඒ හැම තැනක දීම ක්‍රියා කාරිත්වයන්ට මුල් තැනදී කැපවී කටයුතු කිරීම ජයග්‍රහණයේ මුල වනු ඇත.

මැක්සිමස් රෝයි පෙරේරා



## ළමා ප්‍රදීපය 04 වන සංවත්සර කලාපය.....

ළමා ප්‍රදීපය 4 වන සංවත්සර කලාපය සඳහා ඔබගේ නිර්මාණ, සුබ පැතුම්, සැප්. 28 වන දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න.

**ළමා ප්‍රදීපය, 04 වන සංවත්සර කලාපය**

**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**

# දේව අම්මා

පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**විනෝද් නිමේෂාන්**
08 ශ්‍රේණිය
සිරිකුරුස දහම් පාසල,
මුන්නක්කරය



**හිරුණි නිසංසලා**
03 ශ්‍රේණිය
සාන්ත මරියා
ප්‍රාථමික බාලිකා
විදුහල - හලාවත



**තරුෂිකා දෙව්මිණි**
02 ශ්‍රේණිය
සුරදූතික බාලිකා විදුහල
කුලියාපිටිය



**තිසග මිනුවර**
03 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
කරණ (මාදම්පේ මීසම)



**මලිෂා මධුෂාණි ප්‍රනාන්දු**
05 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
හාල්දඬුවන



**ඔනෙලි සෙනෙවිරත්න**
04 ශ්‍රේණිය
ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



**නවිදු පෙරේරා**
**06** ශ්‍රේණිය
සා. රීතා දහම් පාසල - මාවිළිය
(ජා-ඇල මීසම )



**සෙනාල් දිමුතු සංදීප**
02 ශ්‍රේණිය
පාතිමා දහම් පාසල , යායමුල්ල
(වල්පිටගම මීසම)

# අගය කරමු සැමදා අපේ දෙමාපියන්




ආදර දරුවනි, දැන් නම් පාසල් නිවාඩුවත් අවසන් වෙලා ආයෙත් පාසල් යන්නට කාලය ඇවිල්ලා මොනවද ඔබ නිවාඩු කාලේ පොත් පත්වල වැඩට අමතරව දෙමාපියන්ගේ වැඩ කටයුතු වලටත් උදව් වුනාද? මම අද ඔබට කියන්න යන්නේ එහෙම අම්මාට උදව් කරලා සල්ලි ඉල්ලපු දරුවකුගේ කථාවක්. ආදර දරුවෙනි, ඔබ කල්පනා කර බලන්න ඔබත් මේ වගේද කියලා.



තමන් කරන සෑම උදව්වකටම තම මවගෙන් සුළු මුදලක් අයකර ගැනීම නිමල්ගේ පුරුද්දක් විය. තමා කළ සමහරක් උදව්වලට කිසිම මුදලක් නොගෙවූ බව මතකයේ තබාගෙන සිටි නිමල් දිනක් තම මවට මෙසේ පැවසුවා. ''අම්මට අමතක වෙලා වගෙයි, අම්මා මට රු 15 /= ක් ණයයි.'' මෙලෙස පැවසූ නිමල් කොළ කැබැල්ලක තමන් කළ වැඩද අයවිය යුතු මුදලද ලියා මව අත තැබුවේය.

| | |
|---|---|
| පිඟන් සේදීම | - රු . 2 . 00 යි |
| අතුගෑම | - රු . 3 . 00 යි |
| වතුර ඇදීම | - රු . 5 . 00 යි |
| කඩේ යෑම | - රු . 5 . 00 යි |
| එකතුව | - රු . 15 . 00 යි |

මෙය කියවා බැලූ මවද කොළ කැබැල්ලක් ගෙන මෙලෙස ලියා නිමල් අත තැබීය. ''පුතා මම කීයක්වත් ණය නෑ''

| | |
|---|---|
| ලෝකයට බිහි කිරීම | - රු 0 . 00 යි |
| ලේ කිරි කර පෙවීම | - රු 0 . 00 යි |
| උයලා කන්න දීම | - රු 0 . 00 යි |
| පාසල් යැවීම | - රු 0 . 00 යි |
| අසනීපයකදී සැලකීම | - රු 0 . 00 යි |
| එකතුව | - රු. 0 . 00 යි |

ඉන් පසු කිසිම දිනක තමා කළ කිසිම උදව්වකට නිමල් අම්මාගෙන් සල්ලි ඉල්ලුවේ නෑ. ආදර දරුවෙනි බොහෝ විට දෙමාපියන් ඔබ වෙනුවෙන් කොපමණ කැපකිරීම් , වැයවීම් කරනවාද කියා තේරුම් ගන්නේ නෑ. දෙමාපියෝ දරුවන්ට කොච්චර ආදරේද කියලා ළමයි තේරුම් ගන්නේ නෑ. ඒ වගෙම අපි හිතනවා අම්මා තාත්තා ගොඩක් ආදරේ මල්ලිට හරි නංගිට හරි කියලා. එහෙම නැත්නම් අක්කට හරි අයියට හරි කියලා. දරුවෙනි, දෙමාපියන්ගේ ආදරේ බෙදා වෙන්කරන්න බෑ ඒ අය හැමෝටම එකවගේ ගොඩාක් ආදරෙයි දරුවෝ පස්දෙනෙක් ඉන්න අම්මා කෙනෙක්ගෙන් මම දවසක් ඇහුවා ''අම්මා මේ දරුවෝ පස්දෙනා ගෙන් වැඩියෙන්ම ආදරේ කාටද කියලා '' මේ අම්මා පුදුම උත්තරයක් දුන්නා 'මගේ ආදරය අවශ්‍ය මොහොතට අවශ්‍ය කෙනාට මම ගොඩක් ආදරෙයි. මේ දරුවෝ පස්දෙනාගෙන් එක් කෙනෙකුට අසනීප වුනොත් මම එයාට ගොඩක් ආදරෙයි. මේ දරුවන්ගෙන් එක් කෙනෙක් ගමනක් ගියොත් මම එයාට ගොඩක් ආදරෙයි. එයා නැවත ගෙදර එනකම්. දැක්කා නේද දරුවනි අම්මා කෙනෙක්ගෙ ආදරය.

දරුවන් බොහෝ වෙලාවට දෙමාපියන්ගේ අවවාද අනුශාසනා වැරදි ලෙස තේරුම් ගන්නවා. දෙමාපියන් දඬුවම් කළ විට වෛරය සිතේ තියාගෙන ඉන්නවා. මේ නිසාම දෙමාපියන් සමග කථා නොකරන දරුවන්ද ඉන්නවා. එම නිසා ආදරණීය දරුවෙනි, ඔබේ දෙමාපියන්ගේ පරිත්‍යාග අගය කරන්න. ඔවුන් වෙනුවෙන් ඔබ කරන සේවාවට වේතනයක් පඩියක් බලාපොරොත්තු වෙන්න එපා. ඒ අයට ආදරය කරන්න මේ සිංදුව දිහා බලන්න.

**අම්මේ මුතු ඇට වපුරා**
**ඒ මුතු පණමට හරවා**
**අපේ කුසගිනි නිවලා**
**නුඹ කුසගින්නේ ඉඳ හිනැහෙන්නේ**
**අපේ අප්පච්චි**
**නුඹ කුසගින්නේ අපේ අප්පච්චි**

එම නිසා ආදර දරුවෙනි, ඔබේ දෙමාපියන්ව තේරුම් ගන්න . ඔවුන්ව අගය කරන්න.

# ප්‍රහේළිකා අංක 33

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | ■ | 2 | | 3 |
| | ■ | ■ | | ■ | |
| 4 | 5 | ■ | 6 | | |
| 7 | | | | ■ | |
| ■ | | ■ | ■ | 8 | |
| ■ | ■ | ■ | 9 | | |

සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

**හරහට**

1. මෙම නම ඇති මාසයේදී දේව මෑණියන්ට මංගල්‍යයක් පවත්වනු ලැබේ.

2. මරියා සොහොන් ගෙය තුළට නැමී බැලූ විට ක්‍රිස්තුන් වහන්සේගේ සිරුර තබා තිබුණ තැන , දේවදූතයන් දෙදෙනෙකු එක් තැනැත්තෙක් ......... තිබූ තැනද, අනික් තැනැත්තා පාද අද්දරද හිඳුනු දුටුවාය. මෙහි හිස්තැනට සුදුසු වචනයට සමාන වචනයකි.

4. ක්‍රිස්තුන් වහන්සේ තම ප්‍රථම ශ්‍රාවකයන් කැඳවූයේ ගෙනසෙරෙත් ........................ අසලදීය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ගාබ්‍රියෙල් දේව දූතයා මරියතුමීට කතා කොට ''......................... ප්‍රසාද ලත් උත්තමාවිය , ඔබට මංගලම් වේ'' යැයි ප්‍රකාශ කළේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. ක්‍රිස්තුන් වහන්සේ ධර්ම ශාලාවේදී යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථය කියවා ''අද ඔබ සවන් දී සිටියදීම මේ ශුද්ධ ..............පාඨය ඉෂ්ට වී යයි'' වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

8. තමා ............... සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරුවන්නේ යැයි උපදේශකයා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

9. දෙවියන්වහන්සේ විසින් මෝසෙස්තුමාට දෙන ලද පනත් සංඛ්‍යාව

**පහළට**

1. ඊශ්‍රායෙල් ජනයා මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධව පාළු කරයේදී .................. කියන්නට වූහ. හිස්තැනට සුදුසු වචනය

2. දෙවියන් වහන්සේ මෙසේ වදාරණ සේක. ''අහස පොළොවට වඩා බොහෝ ඉහළින් ඇතිසේ නුඹේ සිතුවිලි වලට වඩා මාගේ .................. බොහෝසේ උසස්ය. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ''යහපත් බිරිඳකගේ වැඩකටයුතු වල ........ වර්ණනා කරන්න.'' යනුවෙන් හිතෝපදේශ පොතේ සඳහන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ පාවා දෙන්නේ කවරෙක්දැයි උන්වහන්සේ ගෙන් ප්‍රශ්න කළේ උන්වහන්සේගේ ......................... ළංව හාන්සී වී සිටි ගෝලයාය මෙහි හිස්තැනට සුදුසු වචනය

8. දෙවියන් වහන්සේ ...... නරපතීන් සිය සිහසුන් වලින් පහත හෙළා දීනයන් උසස් කළ බව මරිය තුමියගේ උදන ගීයේ සඳහන් වේ හිස්තැනට සුදුසු වචනය

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ජුවාම් 20/13, ශු. ලූක් 1/ 28 ,යෙසායා 55, ශු. ලූක් 1/ 52 , 4 / 21 , 5 හිතෝපදේශ 31/31, උපදේශකයා හෙවත් සිරාක් 3, නික්මයාම 16/2)**

---

## ප්‍රහේළිකා අංක 32 - ජයග්‍රාහකයෝ

- 1 වන ස්ථානය

  මලීෂා දෙව්මිණි ප්‍රනාන්දු - 08 ශ්‍රේණිය

  සා. කාර්ලෝ බොරෝමෙයෝ දහම් පාසල

  විල්ලෝරාවත්ත

- 2 වන ස්ථානය

  තිළිණ දිල්ෂාන් ප්‍රනාන්දු - 06 ශ්‍රේණිය

  සාන්ත ජෝශප් දහම් පාසල - මැදවච්චිය

- 3 වන ස්ථානය

  ආර් රෝසිටා - 4 ශ්‍රේණිය

  සාන්ත ජෝශප් දහම් පාසල - බලංගොඩ

## ප්‍රහේළිකා අංක 32

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 ච | තා | රි | 2 ක | ■ | 3 තු |
| රි | ■ | ■ | පා | ■ | න |
| ත | ■ | ■ | 4 ල | ය | 5 ට |
| 6 ය | 7 කු | න් | ■ | හ | ■ |
| ■ | ඹ | ■ | 8 සැ | ප | ත |
| 9 ස | ල් | ලි | ■ | ත් | ■ |


රන් කුමාරයයි කිඳුරු කුමාරියයි
කථාව:- ආනන්ද කල්දේරා
15
ෂා: මගේ යාළු කුමාරවරුන්ට මොකද වුණේ මට නම් හිතාගන්න වත් බෑ..
මේක මහ විශාල මාළිගාවක්නෙ.. මාව මෙතනට ආවෙ කොහොමද..? මගේ නැවට මොකද වුණේ...
ඕ මේ තියෙන්නෙ ඇඳුම් ගොඩක්.. කාගෙද මේවා..
කාගෙ උනත් කමක් නෑ ඕනි එකක් වෙන්න මේ එකක් අඳින්න ඕනි
කෑම බීම වලින් මේසය පිරිල.. කාගෙද මේ මාළිගාව.. යන්න ඕනි එළියට.. බලන්න...
ඕ වටේටම මහා මුහුද... විශාල ගල්පරයක් උඩ තමයි මේ මාළිගාව හදල තියෙන්නේ.... හරිම ලස්සන තැනක්...
කුමාරයට වාසිව තනිකම දැනෙන්ඩ පටං ගත්තා.. ඒයාගෙ නැවට.. යාළු කුමාර වරුන්ට මොකද වුණේ කියල හිතාගන්න වත් බැහැ..
ඕ මොකක්ද ඒ ඈතින් ඇහෙන හඬ..?

දඟකාර ළමයෙකු හොඳ ළමයෙකු වූ කතාව......

සැකසුම : තිළිණ අලහකෝන්

# නිවාඩුව




ලබන සතියට